සියවසක් සපුරන
හිඟන කොල්ලා

'හිඟන කොල්ලා' අවුරුදු සීයක් ජීවත් වී ඇති අතර පරමායුෂ සම්පූර්ණ කිරීම සඳහා ඔහුට අවශ්‍ය වන්නේ තව අවුරුදු විස්සක් පමණි. එහෙත් අප මේ කතා කරන්නේ 'හිඟන කොල්ලා' නම් වූ පොත පිළිබඳව මිස මනුෂ්‍ය ප්‍රාණියෙක් ගැන නොවේ.

'හිඟන කොල්ලා' ලියා ඇත්තේ සාහිත්‍ය චක්‍රවර්ති ලෙස කලක් සම්භාවනාවට පාත්‍රව සිටි ඩබ්ල්යු. ඒ. සිල්වා නම් වූ අපූරු ලේඛකයා ය. සියවසක් සපුරන 'හිඟන කොල්ලා' නවකතාව තුළ මෙන් ම මේ අපූරු කතා රචකයා තුළ ද තව බොහෝ කාලයක් ජීවත්වීමේ (පැවතීමේ) ශක්‍යතා ඇති බව අපට සිතුණේ මෑත දිනෙක යළිත් වරක් එහි පිටුපෙරළා බලන්නට යොමු වූ මොහොතේ ය. 1923 වසරේ මාර්තු මාසයේ පිටවූ හිඟන කොල්ලා නවකතාව මේ අවුරුද්දේදී ශතකයක් සපුරන බව අපට මතක් කර දුන්නේ ඩබ්ල්යු. ඒ. සිල්වා පදනමේ ලේකම් රවී තිලකවර්ධන මහතා බව ද මෙහිදී සඳහන් කළ යුතු ය.

'හිඟන කොල්ලා' දහවන මුද්‍රණය 2013 දී ප්‍රකාශයට පත්ව ඇත්තේ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගමේ ප්‍රකාශනයක් ලෙස ය. 1923 වසරේ මේ පොත මුලින්ම පිටවූ අවස්ථාවේ ඩබ්ල්යු. ඒ. සිල්වා ඊට සැපයූ කෙටි සංඥාපනය දහවන මුද්‍රණයේ ද උපුටා දැක්වෙයි. පොත ගැන මෙන් ම ඩබ්ල්යු. ඒ. සිල්වා ලේඛකයා ගැන ද ඒ සියල්ලට ඔබ්බෙන් මේ රටේ සාහිත්‍ය සමාජය ගැන ද නැවතත් හිතන්නට අවකාශයක් විවර කරන්නේ ඒ කෙටි සංඥාපනයයි.

> **මෙම කෘත්‍යය පිළිබඳ අදහස් පළ කිරීම ලෝකයා සතු වැඩකි. මම එය ගැන කිසිවකුත් නොකියමි. එහෙත් මෙහි පැනෙන නම් පමණක් නව ප්‍රබන්ධයකට ම සුදුසු වන පරිද්දෙන් යෙදූ ව්‍යාජ නාමයන් බව කියමි.**
>
> **මෝරුත්, වෙඬරුත්, එකම කිරෙන් ලැබේ. මෝරු කැමැත්තේ මෝරු ගන්නේ ය. වෙඬරු කැමැත්තේ වෙඬරු ගන්නේ ය.**
>
> **එහෙත් කිරට අපවාද නො නගන්නේ ය.**

නිර්මාණ සාහිත්‍ය කෘතියක්, නවකතාවක් කියවීමේදී එහි කතා රසය කෙරෙහි ආකර්ෂණය වූවෝ එකල ද වූහ. මෙකල ද සිටිති. මතු අනාගතයේදී ද එසේ ම ය. එහෙත් එසේ නොවන තවත් පිරිසක් ද සිටී. ඔවුන් නවකතා පොතක් අතට ගන්නේ කතා රසය ඉක්ම වූ කිසිවක් ද අපේක්ෂාවෙනි. කතා රසය අගයන්නන් මෙන් ම ඊට වෙනස් මත දරන්නන් ද මේ තුන්කල්හිම ජීවත් වන්නේ ලෝකය හින්නරුචික වන නිසා ය. ගැටලුවක් පවතින්නේ නම් ඒ වෙඬරුවලට ප්‍රිය කරන්නන් කිරට අපහාස කිරීම සම්බන්ධයෙන් පමණි.

මේ කතාවට ප්‍රාමාණික පිළිතුරක් (නිදසුනක්) සැපයෙන්නේ ඩබ්ල්යු. ඒ. සිල්වා ජන්ම ශත සංවත්සරය යෙදී තිබූ 1990 වසරේදී (ගොඩගේ සහෝදරයෝ ප්‍රකාශනයක් ලෙසින්ම) එළිදැක ඇති එක්තරා පොතකිනි. ඩබ්ලියු. ඒ. **සිල්වා සත්‍යය හා මිත්‍යාව** නම් වූ මේ පොත ලියා ඇත්තේ කැලණි විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මිණිවන් පී. තිලකරත්නයන් ය. පොතේ හැඳින්වීමෙන් පළවන්නේ රටවල් බෙදාගැනීම සඳහා වර්ගභේද ජාතිභේද නිර්මාණය කළ බලවතුන්ගේ කඹඇදිලි හා සමාන තත්ත්වයන් සාහිත්‍ය ක්ෂේත්‍රයේ ද වන බවට ඉඟියකි.

> **මේ කීර්තිමත් ලේඛකයාගේ සාහිත්‍ය සේවය විමර්ශනයට ලක්කිරීම සඳහා 1986 වර්ෂයේ සැප්තැම්බර් 12 වෙනිදා ශ්‍රී ලංකා සාහිත්‍ය මණ්ඩලය මගින් ජෝන් ද සිල්වා රඟහලෙහි අති උත්කර්ෂවත් ලෙස පවත්වන ලද උත්සවය ගැන තවමත් බොහෝදෙනාට මතක ඇතිවාට සැකයක් නැත. මගේ මතකයෙහි විශේෂයෙන් රැඳී ඇත්තේ මේ උත්සවය පිළිබඳ ආරංචිය මුලින්ම දැන ගන්නට ලැබුණු විට**

ඇතැම් වියතුන් විසින් අපෙන් අසන ලද ඇතැම් ප්‍රශ්නවල තිබුණු අවකැපෙන ස්වභාවයයි. 'ඇයි ඩබ්ල්යු. ඒ. සිල්වා ගැන උත්සවයක් මේ හදිස්සියෙම?' 'සිංහල නවකතාව අයෙමත් ඩබල්යු. ඒ. සිල්වා යුගයට යවන්ඩ වෑයමක් ද මේ?' යන දෙක මේ ප්‍රශ්නවලින් සාම්පලයක් පමණි.

උත්සවය කෙසේ පැවැත්වෙන්නේ දැයි හරිහැටි දැනගන්නට ලැබීමටත් පෙරම එය 'ඩබ්ල්යු. ඒ. සිල්වා පාක්ෂිකයන්' විසින් හඳුන්වා දෙන ලද්දේ ඩබ්ල්යු. ඒ. සිල්වාට මඩ ගහන යටි අදහස ඇතිව කරන්නට යන වැඩක්' ලෙසිනි. උග්‍රමාර්ටින් වික්‍රමසිංහවාදියෝ මෙය 'ඩබල්යු. ඒ. සිල්වා හුවාදක්වා මාර්ටින් වික්‍රමසිංහට දැනට ලැබී ඇති තැන නැතිකරන්ඩ ගනු ලබන වෑයමක් සේ දුටුවහ.

(ඩබ්ල්යු. ඒ. සිල්වා-සත්‍යය හා මිත්‍යාව - හැඳින්වීම)

මේ වූ කලී ඩබ්ල්යු. ඒ. සිල්වාගේ නවකතා පිළිබඳව ඉතාමත්ම අසාධාරණ විචාරමත සමූහයක් ව්‍යාප්ත වී තිබීමේ එක් ප්‍රතිඵලයකි යි පවසන මිණිවන් පී. තිලකරත්නයෝ මෙසේ ද පවසති.

'ඩබ්ලියු. ඒ. සිල්වා - සත්‍යය හා මිත්‍යාව' නම් වූ මේ පොත මවිසින් ලියන ලද්දේ මෙම විචාර මත ද සැලකිල්ලට ගනිමින් ඩබ්ල්යු. ඒ. සිල්වාගේ නවකතා යළි හඳුනාගැනීමේ උත්සාහයක යෙදෙනු පිණිසයි.

අපගේ මතකය නිවැරදි නම් මේ රට තුළ එදා-මෙදා තුර සිනමාවට නැඟුණු නවකතා අතරින් අතිමහත් බහුතරයක් ලියා ඇති ලේඛකයා වන්නේ ඩබ්ල්යු. ඒ. සිල්වා ය. සිනමාකරුවන් (නිෂ්පාදකයන් සහ අධ්‍යක්ෂවරුන්) බොහෝ විට අත ගසන්නේ රටේ වැඩිදෙනෙකුන්ගේ කැමැත්ත, ආකර්ෂණය දිනා ඇති නවකතාවලට ම බව ද අවිවාදිත ය. ඊට තවත් හේතුවක් ලෙස දැක්විය හැකිවන්නේ ඩබ්ල්යු. ඒ. සිල්වාගේ හැම නවකතාවකටම ආවේණික වූ සිද්ධි බාහුල්‍යය ද වීමට පුළුවන. කෙසේ වුව ද ඩබ්ල්යු. ඒ. සිල්වාගේ නවකතාවල කියවීමේ රුචිකර බවක් (Readable) වන බව නම් පැහැදිලි ය. හිඟන කොල්ලා නවකතාවේ පිටු පෙරළමින් එය මතක් කර ගන්නට දැරූ මේ වෑයම අතරතුර මෙවර ද අපට කිසිදු උදාසීනතාවක් නොදැනිණ.

හිඟන කොල්ලාහි ප්‍රවේශයම සිත්ගන්නාසුලු ය; කුහුලදනවනසුලු ය; එය බොහෝසෙයින් ගැළපෙන්නේ රූප මාධ්‍යය සඳහා ය; සිනමාව සඳහා ය. කතාව ඇරඹෙන්නේ අහස මහ වැස්සකට අර අදිමින් ඇති අවස්ථාවකිනි. පැල්පතක සිටින රූමත් තරුණියක් (ළමාහාමි යනු රූමතියගේ නමයි) මිදුලට දිව යන්නේ වැස්සට පෙර වී පැදුරක් ගෙට ගැනීමට ය.

මේ ගෙය පිටිසර බද වෙල් යායකට නුදුරු, කැලෑ රොදක, හුදෙකලාව පිහිටියේ ය. එය මැටියෙන් බඳනා ලද උස් පිළකින් හා සාලාවකින් ද, කුඩා කාමර දෙකකින් ද යුක්ත වූ පොල් අතු හොයන ලද පැල්පතකි. මිදුලේ පොල් ගසක බැඳ රඳවන ලද කිරි එළදෙනෙක්, වර්ෂා වලාහකයාට අචාර පවත්වන නියායෙන්, කරබාගත් වනම, මහ වැස්සේ, තෙමී-තෙමී සිටියා ය. උස් පිළට වූ ඇයගේ පැටවා ද සීතලෙන් වෙව්ල-වෙව්ලා සිටියේ ය. ගෙය මැද හෙවත් සාලාවේ මැද, මුදුන් පරාලයක එල්වන ලද පිත්තල පහනක් ද, පසකින්, මැදින් ඉරී, බොකු ගැසුණු බූරු ඇඳක් ද, එම ඇඳ යට ලෙලි පිටින් පොල් ගෙඩි කීපයක් හා කොස් ගෙඩියක් ද, සාලාවේ අනෙක් කොනේ, දැලි කුණු වැකුණු පඩංගුවක් අතුරන ලද රවුම් මේසයක් ද විය. මේ මේසය උඩ, බූමිතෙල් කුප්පි දෙකකුත්, බත්තළඳක් හා නෑඹිලියකුත්, බොකු පිඟන් කිහිපයක් හා ලොකු කෝප්පයකුත් විය. මේසයට නුදුරුව, කොහු ලනුවලින් වියන ලද පරණ හැඩේ පුටු දෙකක් ද විය. එයිනෙක් පුටුවක, වක ගසා උණුසුම්ව බුදියෙන බළලෙක් ද වූයේ ය.

(හිඟන කොල්ලා ප්‍රස්තාවනාව)

පැල්පතේ ස්වභාවයක් පෙන්නා දීම සඳහා මෙහිදී සිල්වා සූරින් අපූරු චිත්තරූප සමුදායක් චිත්‍රණය කරයි. ළමාහාමි ජීවත්වන නිවෙස, ඒ පරිසරය පිළිබඳ හැඟීමක් පාඨකයා තුළ ද ජනනය වන්නේ ද ඒ අනුව ය. රූපරාමු නැතත් ළමාහාමිගේ දෛනික දිවිසැරියේ තනු චිත්‍රපටයක් මෙන් ඇඳී යන්නේ පාඨක මනසේ ය.

තරුණිය හැරුණුවිට මේ පැල්පත තුළ වෙසෙන්නේ ඇගේ මාමා වන 'දියතලන්' නම් වූ සූදුඅන්තුවා ය. වැස්ස තව-තවත් තදවන විට වැස්සෙන් බේරීම සඳහා මිදුලට පැමිණෙන්නේ අශ්වාරෝහකයෙකි; අශ්වාරෝහකයා කඩවසම් තරුණයෙකි; දඩයක්කාරයෙකි. ළමාහාමි දැකීමෙන් තරුණයා තුළ හටගන්නේ විස්මයක් හා ප්‍රහර්ෂයකි. දඩයක්කාරයා සතිපතා දඩයමේ එන්නට පටන් ගන්නේ එදා පටන් ය. ඔහුගේ අලුත්ම දඩයම බවට පත්වන්නේ ළමාහාමි ය. ඒ ගමනට හිත තැබෙන්නේ ළමාහාමි ගැබ්ගෙන ඇති බව තරුණයා දැනගත් දවසේ ය.

'හිඟන කොල්ලා' චිත්‍රපටයේ ද මේ අපූරු දර්ශන පෙළ උචිත ලෙස හා සෞන්දර්යාත්මක ලෙස තිරයට නැඟී තිබූ අයුරු අපට සිහි කළ හැකි ය. 1979 අප්‍රේල් 14 දා තිරයට නැගුණු හිඟන කොල්ලා චිත්‍රපටය අධ්‍යක්ෂණය කළේ කේ. ඒ. ඩබ්ලිව් පෙරේරා ය. රූමත් ළමාහාමිගේ චරිතය නිරූපණය කළේ මාලිනී ෆොන්සේකා ය.

පිතෘභාවයට සූදානම්ව නොසිටි සෙල්ලක්කාර දඩයක්කාරයාගේ පලායාම සිදුවන්නේ ද මේ අලුත් පුවත දැනගත් සැණිනි. ඉනික්බිතිව කොළඹ වීදියක් වීදියක් පාසා සිඟායමින් මහා නගරය තුළ එහා මෙහා යන රථයක් රථයක් පාසා දඩයක්කාරයාගේ මුහුණ සොයමින් සිටින ස්ත්‍රිය වන්නේ ද ළමාහාමි ය. ගබ්සාව ප්‍රචලිතව නොතිබූ කලෙක ගැබ්ගෙන සිටින ළමාහාමි බලාපොරොත්තු වෙමින් සිටින්නේ මළදරු උපතකි. එහෙත් ප්‍රසූතියෙන් පසු දරුවාගේ කෙදිරිලි හඬ, හැඬුම් හඬ ඇසූ සැණින් ඇගේ රළු සිත මුදු වෙයි. ඉනික්බිතිව දරුවා ද සමඟ සිඟමන් යදින ගැහැනිය දරුවා කුසගින්නෙන් හඬද්දී ගොදුරු වන්නේ කරකියාගත හැකි කිසිවක් නොවීමේ බේදයට ය. ආහාර අහේනිය හේතුවෙන් දරුවාගේ කිරි සිඳීයද්දී ඇය අනුක්‍රමයෙන් ළංවන්නේ ස්වයංඝාතනයක් කරා ය. කැලණි පාලම අසලට ඇය පැමිණෙන්නේ දිවිනසා ගතහැකි පහසුම ක්‍රමය හඳුනාගනිමිනි.

ස්වයංඝාතනයේදී පවා ගැහැනියට ඇති බාධක පෙන්වාදීමට මෙහිදී ඩබල්යු. ඒ. සිල්වා අමතක නොකරයි. පුරුෂයාට මෙන් පිස්තෝලයකින් වෙඩිතබා ගැනීමට හෝ කිනිස්සකින් ඇණ ගැනීමට හෝ ළඳකගේ සියුමැලි බව ඉඩ නොදෙන අයුරු ද ඒ අනුව මෙසේ ලියැවී තිබේ.

'සිය පණ නසනු කැමති ගැහැනිය විසින් බොහෝ සේ සොයනු ලැබේ නම් ඒ ගං-හෝ-ඇළ-දොළ-වැව් ආදි දියකඩක්ම ය.'

පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට අලුත් කතාවකට ප්‍රවේශයක් ලබා ගන්නා කතුවරයා, ඊළඟ පරිච්ඡේදයෙන් පාඨකයාගේ අවධානය යොමු කරන්නේ මරදානේ අඳුරු අහුමුල්ලක පිහිටි තේ කඩයක් කෙරෙහි ය.

> **මේ තේ පැන් සැලේ විනාඩියෙන් විනාඩියට නිතර නිවෙන, රොඩු සුරුට්ටු කොටයක් උර-උරා, තරහයෙන් පිපිරි-පිපිරී, දත් කුරු කකා පසු වන්නකු දක්නා ලැබේ. ඔහු කොලුවෙකි-වැරහැලි කිලිටි කලිසම් කොටයක් හා කමිස කඩමාල්ලක් හැඳගත් කොලුවෙකි. ඔහු තලෙළු ය - උස ය - ශක්තිමත් ය - කළු දළ අවුල් හිසකේ ආදියෙන් අපිරිසිදු හිසක් ඇති මුත්, මුහුණ රූමත් ය. එහෙත් පුලුටු ය. ඔහු නූගතෙකි - මළපතේ අකුරක් නොදත් නූගතෙකි. එහෙත් ඔහු සහජ බුද්ධියක් ඇත්තෙකි. එහෙයින් එකම දෙයක් ඔහු දන්නේ ය - මුළු පොළොව සහ එහි ඇති තාක් සියලු දෙයත් තමාට සතුරු බව පමණක් දන්නේ ය. මේ දුම් වැටිය පවා ඔහුට සතුරු ය. එය හොඳ හැටි නො දැවෙන්නේ, තමාට හිංසා කරන අදහසින් ම ය.**
>
> *(හිඟන කොල්ලා - 45 පිටුව)*

කතුවරයා මෙසේ ඉදිරිපත් කරන්නේ හිඟන කොල්ලාගේ ගතිලක්ෂණ ය. (චිත්‍රපටයේ මේ චරිතයට පණදෙමින් අපූරු රංගනයක් ඉදිරිපත් කරන්නේ විජය කුමාරතුංග ය.)

හිඟන කොල්ලාගේ නම සයියා ය. තේ කඩය තුළ සයියාගේ ක්‍රියාකාරකම් කෙරෙහි සෝදිසිමත්ව සිටින පේදුරු නම් වූ තැරැව්කරුවාට සිතෙන්නේ මේ කාත් කවුරුවත් නැති අනාථයා තමාට

ඉල්ලමක් කරගත හැකිවනු ඇතැයි කියා ය. කොල්ලාගෙන් වතගොන විමසන පේදුරුට සයියා කියන්නේ මෙසේ ය.

> **'මොක ද කරන්නේ! මගේ අම්මාට යි තාත්තාට යි හෙණ ගහන්න - මේ උන් මට කළ හදිය තමා. උන් මට ඉගැන්නුවේ හිඟා කන්නයි. නමුත් මට දැන් ඒක එපා වෙලා.**
>
> *(හිඟන කොල්ලා - 49 පිටුව)*

මීළඟ පරිච්ඡේදය නම් කර ඇත්තේ සයියාගේ පියා - වයියා ලෙස ය. සයියා එහිදී වයියා ගැන කරන විස්තරය හිඟමන සඳහා මගට බහින්නට පෙර නළුවන් මෙන් පාට ආලේප තවරා ගනිමින්, තුවාල දද කැළැල් නිර්මාණය කරගන්නා නූතන හිඟන පරපුරට ද අදාළ ය.

> **මගේ තාත්තාත්, අම්මාත්, මාත්, අපි ඔක්කොම හිඟන්නෝ. හිඟන්නා වුණාට මොක ද, මගේ තාත්තා මහ නපුරු මිනිහා. අලි ම අලි හොරා. ඔහුට හෙණයක් වත් නැහැ - ඒකට මොකද කණෙක්, පොට්ටයෙක්, කොරෙක්, ගොළුවෙක්, බිහිරෙක් වාගේ ඕනෑ කෙනෙක් රවටලා හිඟමන් ගන්න දන්නවා. මගේ පිට පැළෙනකං තළ-තළා, එයා ඉගැන්නුවේ, මේවා කරන හැටි තමා. නාහෙන් කටින් පෙන දමා ගෙන අපස්මාරකාරයෙක් වාගේ වැටෙන්න ඉගැන්නුවේත් එයා ම තමා. අපේ අම්මා බොරුවට පිස්සු ගන්වා, ඉඟටියෙන් බැඳගෙන පාරක් ගාණේ නටව-නටවා හිඟමන් ගන්නවා. එයාට මේ පිස්සු ගෑනි නිසා රැකීමක්-රස්සාවක් කරගන්න හැටියක් නැත-දැන් මේ ලෙඩේට වෙදකම් කරලා අතේ ඇති දේ නැති වෙලා ය-බේත් හේත් කරන්න තියා කන්න දෙන්න වත් බැරි තරමට හිඟපාඩුවෙලා ය කියා, මුදල් එකතු කරනවා.**
>
> **තවත් කාලෙක එයා ඔලගුවක් කරේ දමා ගෙන වන්දනා කාරයෙක් වාගේ පිටිහර යනවා. ඒ ඔලගුවේ නැති උළුවිවක් නැහැ. ගල් කැට, අළු හෙප්පු, මිනීඇට කෑලි, වේලිච්ච බෝ කොළ, වතුර බෝතල, ඔහොම කෙළවරක් නැති දේ ඕකේ තියනවා. ඉතින් කෝපි කඩයක් ගාණේ ගොහින්, මේ කුණු-කසල එළියට අරන්, මෝඩ ගෑනු රවටා, සම්මාදම් ගන්නවා. ගල් කැට, නේරංජා ගඟේ ගල් ලු. වතුර අනෝතත්ත විලේ වතුර ලු. අළු බුදු හාමුදුරුවන්ගේ දර සෑයේ අළු ලු. බෝකොළ ජයසිරිමහ හාමුදුරුවන්ගේ කොළ ලු. ඔය වැලි, ලුම්බිණි උයනේ වැලිලු-ඇට කෑලි සීවලී හාමුදුරුවන්ගේ දාතු ලු.**
>
> *(හිඟන කොල්ලා - 52 පිටුව)*

මිනිසුන්ගේ මිත්‍යා විශ්වාසවලට, ඇදහිලිවලට ගර්හා කිරීම කෙසේ වෙතත් ඒවා දෙස උත්ප්‍රාසයෙන් බැලීමට බොහෝ අවස්ථාවලදී කතුවරයා යොමුවෙයි. ලොක්කන් අනුව ජීවත්වන්නට වෙර දරණ සොක්කන්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි ද කතුවරයාගේ බොහෝ නවකතා හෙළන්නේ සෝපහාසී බැල්මකි. 'සයියා' හෙවත් 'හිඟන කොල්ලා' සිය දිවියේ එක්තරා රූපාන්තරණයකට මුහුණ දෙමින් සිටින මතුයම් දිනෙක ඉහළ සමාජය සම්මුඛ වීමේදී, ඔවුන් හා මුසුවීමේදී ඒ ඒ චරිත ස්වභාවයනට අනුව, ඇවතුම් පැවතුම්වලට අනුව ක්‍රියාත්මක වන්නට තතනන අයුරු ඔහුගේ අනුකාරක චින්තනය මෙහිදී ඉස්මතු කෙරෙන්නේ ද හාස්‍ය දනවන අයුරිනි.

කෙසේ වුව ද මහාචාර්ය මිණිවන් පී. තිලකරත්න 'ඩබ්ලියු. ඒ. සිල්වා සත්‍යය හා මිත්‍යාව' කෘතියෙන් බොහෝදුරට උත්සාහ කර ඇත්තේ මධ්‍යස්ථ විමසුමක යෙදෙන්නට බව පෙනී යයි. මෙහිදී ඔහු විශේෂයෙන් සඳහන් කරන්නේ ඩබ්ල්යු. ඒ. සිල්වාගේ නවකතාවල චරිත නිරූපණය පිළිබඳව ය.

> **චරිත නිරූපණයේදී කිසියම් එක් වැකියකින් එක් චරිතයක් පිළිබඳව සම්පූර්ණ තක්සේරුවක් ඉදිරිපත් කිරීමට ඩබ්ල්යු. ඒ. සිල්වා තුළ ඇති කැමැත්ත හිඟන කොල්ලා නවකතාවේ නොයෙක් චරිත නිරූපණය කොට ඇති සැටියෙන් ද ප්‍රදර්ශනය වෙයි.**

දියතලන් 'සවිබල ඇති අසත් පුරුෂයෙකි' යැයි එක එල්ලේ නිගමනය කරන ඩබ්ල්යු. ඒ. සිල්වා සර් හෙන්රි විජයකෝන් විටක යමයාට බඳු නපුරකු ලෙසින් විස්තර කරයි. මෙසේ චරිත නොයෙක් වර්ගවලට වැටෙන අයුරින් නිරූපණය කොට තිබීම විද්වත් ජනයාගේ නොකැමැත්තට හේතුවන අංගයක් වන නමුත් වැඩි උගත්කම් නැති බොහෝදෙනා එය ප්‍රිය කරති. කිසියම් චරිතයක් 'හොඳ ද?' නොඑසේ නම් 'නරක ද?' යන ප්‍රශ්නයට එක එල්ලේ දිය හැකි පිළිතුරක් ඔවුහු පතති. හොඳ චරිතය ඔවුහු වැළඳ ගනිති. නරක චරිතය නොසැලකිල්ලට ලක්කරති.

(ඩබ්ල්යු.ඒ.සිල්වා-සත්‍යය හා මිත්‍යාව - 72-73 පිටු)

සයියා හෙවත් හිඟන කොල්ලාගේ ඉරණම් ගමන පිළිබඳව කතුවරයා විචිත්‍ර කතාවක් ගොතයි. නීති ශිෂ්‍යයකු බවට පත්වී බොහෝ අභියෝග ජයගනිමින් අධිනීතිඥවරයකු ලෙසින් ද දිවුරුම් දෙන සයියාගේ විවාහය සිදුවන්නේ ද දෛවෝපගත ආකාරයකිනි. මැරියන් සමරසිංහ නම් වූ තරුණිය සයියාට මුණගැසෙන්නේ ද අහඹු ලෙස ය. සබන් කැල්ලක් සපා කටින් පෙණ උතුරමින් මීමැස්මොර රෝගියකු සේ සයියා රැඟුමක් පාන අවස්ථාවක ඔහුට උදවුවීම සඳහා ළංවන නන්නාඳුනන තරුණිය වන්නේ මැරියන් ය. අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නා සයියා ඉතා සූක්ෂ්ම ලෙස මේ මොහොතේදී ඇගේ මාලය කඩාගත්ත ද, තරුණිය පවා එය දැන සිටිය ද ඇගෙන් ඔහුට දිගින් දිගට ම ලැබෙන්නේ අරුම පුදුම ක්ෂමාවකි; දයානුකම්පාවකි. වික්ටර් හියුගෝ ලියූ 'ලේ මිසරාබ්ලේ' නවකතාවේ කාරුණික පියතුමකුගේ පරිත්‍යාගය හේතුවෙන් නගරාධිපති අසුන කරා දිගු ගමනක් ගිය සිරකරුවා සිහිගන්වන ආකාරයේ භූමිකාවක් මෙහිදී මැරියන් ද නිරූපණය කරයි.

'හිඟන කොල්ලා' ප්‍රකාශයට පත්වූයේ 1923 වසරේ වන බව සිහිකැඳවන මහාචාර්ය මිණිවන් පී. තිලකරත්නයන් පවසන්නේ ඒ යුගයේදී නවකතාවක් ජනප්‍රිය වීමට අවශ්‍ය වන සියලු අංග මේ නවකතාව තුළ වූ බව ය.

කළු චරිත, සුදු චරිත ලෙස මිනිස් ජීවිත වර්ගීකරණය කළ නොහැකි වන බව සැබෑ ය. ලෝකයේ ජීවත්වන අතිමහත් බහුතරය කළු හෝ සුදු නොවන අළු පැහැයකට හුරුවූවන් යැයි අපි විශ්වාස කරමු. එහෙත් පාරිසරික සාධක නිසා හෝ වෙනත් කවර හේතූන් මත හෝ ජීවිත කාලය මුළුල්ලේම අතිමහත් බහුතරයක් විසින් චෞරයන්, ඝාතකයන් වශයෙන් හඳුන්වනු ලබන මනුෂ්‍යයෝ ද ඉඳහිට හෝ ලොවෙහි වෙති. එහි අනිත් පැත්තක් ද තිබිය හැකි ය.

කෙසේ වුව ද ලේඛකයා නිර්මාණකරණයේ යෙදෙන්නේ තමා ජීවත්වන කාලයට සමාජයට අනුරූපව ය. වෙළෙඳ භාණ්ඩ නොම්මර එකේ සිට පහළට වර්ග කරනු ලැබෙතත් ලේඛකයන්ගේ වටිනාකම් ඒ ආකාරයෙන් තක්සේරු කළ නොහැකි යැයි මහාචාර්ය මිණිවන් පී. තිලකරත්නයන් පවසන්නේ ද ඒ නිසා ය. සැසඳීමේ ආදීනව මෙසේ පෙන්වා දී ඇත්තේ ඒ අනුව ය.

ඇත්ත වශයෙන් නම් එක් ලේඛකයකුගේ සේවය තවත් ලේඛකයකුගේ සේවයත් සමඟ සැසඳීමකට ලක්කිරීමට පුළුවන්කමක් නැත. ඩබ්ලියු. ඒ. සිල්වාගේ විජයබා කොල්ලය හෝ සුනේත්‍රා හෝ සමඟ සසඳාලිය හැකි නවකතාවක් මාර්ටින් වික්‍රමසිංහගේ නවකතා අතර නැත. එමෙන්ම ගම්පෙරළිය හෝ විරාගය ඩබ්ලියු. ඒ. සිල්වාගේ කිසියම් නවකතාවකට සම කළ නොහැකි ය.

(ඩබ්ල්යු.ඒ.සිල්වා-සත්‍යය හා මිත්‍යාව - 162-1633 පිටු)

ඩබ්ල්යු. ඒ. සිල්වාගේ කතාකලාව තුළින් ඉස්මතුවන තවත් ලක්ෂණයක්, සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ඒවා චිත්‍රණය වී ඇත්තේ චලනචිත්‍රය, රූපමාධ්‍යය සඳහා අතිශයින් යෝග්‍ය වන ආකාරයකට වීම ය. 'හිඟන කොල්ලා' නවකතාව චිත්‍රපටයකට නැඟීමෙන් නොනැවතී, ටෙලිනාට්‍යයක් ලෙසින් ද නිර්මාණය වන්නට ඇත්තේ ඒ නිසා ය.

කැත්ලීන් ජයවර්ධන

printgraphic2@gmail.com